# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,669 — 1966 පෙබරවාරි 11 වැනි සිකුරාද — 1966.2.11

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## II වැනි කොටස — අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පනත් ... ... ... | — | පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම ... ... | 48 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම ... ... ... | — | මුදල් නඩු පිළිබඳ දැන්වීම ... ... ... | 48 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම ... ... ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම ... | 47 | නොතාරිස් ලැයිස්තුව ... ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම ... ... | — | විවිධ දැන්වීම ... ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන් පත් කිරීම ... ... | — | | |


## දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම්

### සංචාරක උසාවිය, කිළිනොච්චිය

කිළිනොච්චියේ පවත්වනු ලබන සංචාරක මහෙස්ත්‍රාත් උසාවිය ක්‍රි. ව. 1966 දී පහත සඳහන් දිනවල පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම දිනයන් වෙනස් කිරීමට ඉඩ තිබේ.

බී. ආර්. සිල්වා,
මහෙස්ත්‍රාත්, චාවකච්චේරිය.

1966 ජනවාරි මස 22 වැනිදා,
චාවකච්චේරියේ මහෙස්ත්‍රාත් උසාවියේ දීය.

ජනවාරි : 66.1.12, 66.1.26
පෙබරවාරි : 66.2.9, 66.2.23
මාර්තු : 66.3.9, 66.3.23
අප්‍රේල් : 66.4.9, 66.4.23
මැයි : 66.5.7, 66.5.21, 66.5.31
ජූනි : 66.6.15, 66.6.29
ජූලි : 66.7.13, 66.7.27
අගෝස්තු : 66.8.10, 66.8.24
සැප්තැම්බර් : 66.9.8, 66.9.22
ඔක්තෝබර් : 66.10.4, 66.10.19
නොවැම්බර් : 66.11.2, 66.11.16, 66.11.30.
දෙසැම්බර් : 66.12.14, 66.12.28

2-234

### විශේෂ නිවේදනයයි

නිෂ්පාදන වියදම් අධිකවීමේ හේතුන් නිසා ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීමේ ගාස්තු වැඩි කිරීමට තීරණය කර ඇත. දැනට පවතින අඟලකට රු. 10ක් සහ වැඩිවන සෑම අඟලක් හෝ ඉන් කොටසක් සඳහා රු. 10 බැගින් අය කරනු ලබන ගාස්තුව වෙනුවට, 1966 මාර්තු මස 1 වෙනි දින සිට, වෙළඳ ලකුණු දැන්වීම් හැර, අන් සියළුම දැන්වීම් සඳහා තනි තීරුවේ සෑම අඟලකට හෝ ඉන් කොටසකට රු. 15 බැගින්ම අය කරනු ලබන බව සැමදෙනාගේම දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1966 පෙබරවාරි මස 11 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

# පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

## මධ්‍යම පළාත

### මහනුවර දිස්ත්‍රික් උසාවියේ දීය

කටුගස්තොට මඩවල පාරේ අංක 42 හි පදිංචි ගමේ ගුරුන්නාන් සෙලාගේ ගෙදර නූහු ලෙබ්බේගේ පුත් හබීබු මොහමඩ් ...................................................... පැමිණිලිකාරයා.

නොම්මරය : ඇම්. ආර්. 8258 එදිරිව

මහනුවර, යටිනුවර වීදියේ අංක 110 හි පදිංචි කේ. බී. ඇස්. රණවීර ...................................................... විත්තිකාරයා.

මෙහි පහත සඳහන්වෙන දේපලවලින් ඉහතකී නඩුවේ විත්තිකාරයාට පහත සඳහන් දේපලට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් වර්ෂ 1966 ක්වූ මාර්තු මස 11 දින උදේ 11 පැයට එකී ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ. රුපියල් 3,250 ක් හා අනෙකුත් මුදල් ඇතුලු පවුන් ඩේජ් මුදල් ඇදිය අයකර ගැනීම සඳහායි.

එනම් :—මධ්‍යම පළාත මහනුවර දිස්ත්‍රික්කයේ පාත හේවාහැට ගන්දහයේ කෝරළේ ගුරුදෙනියේ පිහිටා තිබෙන අක්කර දෙකයි, රූඩ් දෙකයි, පර්චස් විසිපහක (අ. 2, රූ. 2, ප. 25) වපසරිය ඇති මීගොන්පට්ටියේ ගෙදර හේන නැමැති ඉඩමට මායිම් :—උතුරට : ඩිංගිරාලගේ ඉඩමද, නැගෙනහිරට : 51061 නොම්මරය දරණ ප්ලෑනේ විස්තර වන ඉඩමද, දකුණු බස්නාහිරට සහ බස්නාහිරට : 51050 නොම්මරය දරණ ප්ලෑනේ විස්තර වන ඉඩමද සහ ඊට අයත් සියලුම දේ වේ.

මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කායභාලයේ අංක ජී 146/220 යටතේ ලියා පදිංචි කර තිබේ.

ර. මූ. ජ. රත්නායක,
ම. ප. පිස්කල් වෙනුවට.

1966 ක්වූ පෙබරවාරි මස 2 වැනි දින,
මහනුවර පිස්කල් කායභාලයේ දීය.

2-349

## දකුණු පළාත

### මාතර දිස්ත්‍රික් නඩු ශාලාවේදීය

දෙනිපිටියේ/විත්ටන් විජේරත්න වික්‍රමසිංහ ......................................................
...................................................... පැමිණිලිකාරයා

නොම්මරය : ඇම්. ඇස්. 25. එදිරිව

දෑනට බානගල චාල්ස් වීරදිවාකර හෙවත් චාල්ස් වික්‍රම ආරච්චි වීරදිවකර ...................................................... විත්තිකාරයා

මෙහි පහත සඳහන්වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකාරයාට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් රුපියල් 3,023/37½ක් අයකරගැනීම පිණිස වෂී 1966 ක්වූ මාර්තු මස 8 දින උදය 10 පැයට එම ඉඩමේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක්කෝරළේ, බානගල පිහිටි අන්නාසිගල හේන (පරණවිලවත්ත නමින්ද හැඳින්වෙන) ඉඩමට මායිම් : උතුරට, නැගෙනහිරට, දකුණට සහ බස්නාහිරට : රාජසන්තක ඉඩම් ද මායිම් වූ අක්කර 49, රූඩ් 3, පර්චස් 22ක් විශාල ඉඩමේ වවා තිබෙන රබර් සහ තේ වැවිල්ලද වේ.

වෂී 1966 ක්වූ ජනවාරි මස 25 වෙනි දින
මාතර පිස්කල් කන්තෝරුවේදීය.

ඩී. ටී. සහබන්දු,
අතිරේක- නියෝජ්‍ය පිස්කල්.

2-247

## වයඹ පළාත

### කුරුණෑගල දිස්ත්‍රික් නඩු ශාලාවේ දී ය

මැද්දෙකැටිය කෝරලේ වනමුල්ලේ පදිංචි රණවදේපේඩි දූරයලාගේ කිරියා වෙද ...................................... පැමිණිලිකාරයා.

නොම්මරය : 8794/පී. එදිරිව

මැද්දෙකැටිය කෝරලේ අලගිටියාවේ පදිංචි අකුරන්පේඩිගේ සෝමරත්න සහ තවත් අය .............................. විත්තිකාරයා.

මෙහි පහත සඳහන්වෙන දේපළවලින් ඉහත කී නඩුවේ 2 වෙනි, 3 වෙනි සහ 8 වෙනි විත්තිකාරයින් ට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයත් වර්ෂ 1966 ක්වූ මාර්තු මස 8 දින අපර භාග 3 ට ඉඩමේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොල හත්පත්තුවේ මැද්දෙකැටිය කෝරළේ අලගිටියාවේ පිහිටා තිබෙන වල්බරා පිටියේ කුඹුර 1963ක්වූ දෙසැම්බර් මස 18 වෙනි දින එස්. ආර්. යාපා අවසර ලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 1744 දරණ ප්ලෑනේ සඳහන් ලොට් 2 ඒ දරණ රූ. 2, ප. 37ක් විශාල කොටසට මායිම් :—උතුරට : මිටියාට සහ කොහොඹාට අයිති වල්බරා පිටිය කුඹුරද ; නැගෙනහිරට : ඉහත කී ප්ලෑනේ ලොට් 2 බී දරණ කොටසද ; දකුණට : බෝගහමුල කොටුවද ; බස්නාහිරට : ඉහත කී ප්ලෑනේ ලොට් 1 ද යන මායිම් තුළ පිහිටි කොටස වේ.

ඇස්කීසියේ මුදල රු. 519.20ක්ද, පිස්කල් ගාස්තු ආදියත් අයකර ගැනීමටය.

ලයනල් අ. පොතුහැර,
වයඹ පළාතේ පිස්කල් වෙනුවට.

වර්ෂ 1966 ක්වූ ජනවාරි මස 30 වෙනි දින,
කුරුණෑගල පිස්කල් කන්තෝරුවේ දීය.

2-348

# බූදල් නඩු පිළිබඳ දැන්වීම්

### කෑගල්ලේ දිස්ත්‍රික් උසාවියේ දීය

#### නයිසයි ආඥාවයි

බැද්දවෙල සිට නැසීගිය ඉද්දවල මුදියන්සෙලාගේ පුංචිබණ්ඩාගේ අන්තිම කැමැති පත්‍රයක් නොමැති බූදලය සම්බන්ධවයි.

බැද්දවෙල පදිංචි දිසානායක මුදියන්සෙලාගේ කුසුමාවතී. ............ ...................................................... පෙත්සම්කාරිය.

තෙස්තමේන්තු නඩු නො. 2109 එදිරිව

1. බැද්දවෙල පදිංචි ඉද්දවල මුදියන්සෙලාගේ ගුණරත්න.
2. බැද්දවෙල පදිංචි ඉද්දවෙල මුදියන්සෙලාගේ ජයසිංහ.
3. බැද්දවෙල පදිංචි ඉද්දවල මුදියන්සෙලාගේ සෝමාවතී.
4. බැද්දවෙල පදිංචි ඉද්දවල මුදියන්සෙලාගේ සිරිමාන්න.
5. බැද්දවෙල පදිංචි ඉද්දවල මුදියන්සෙලාගේ සීතා හෙවත් සෝමා.
6. බැද්දවෙල පදිංචි ඉද්දවල මුදියන්සෙලාගේ ජයවර්ධන බණ්ඩා.

...................................................... වගඋත්තරකාරයෝ.

පෙත්සම් කාරිය වෙනුවෙන් පෙරකදෝරු තැන්පත් බී. එච්. සෙනෙවිරත්න මහතා පෙනී සිටියදී වර්ෂ 1965 ක්වූ ඔක්තෝබර් මස 1 වෙනි දින කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන්පත් සී. එච්. උදලාගම මහතා ඉදිරිපිට දී මෙම කාරණය විභාග කිරීම පිණිස පෙත්සම් කාරියගේ 1965 ජූලි මස 22 වෙනි දින දරණ පෙත්සම සහ 1965 ජූලි 19 දින දරණ දිවුරුම් පෙත්සම කියවා බලා ......................................

ඉහත නම් සඳහන් වග උත්තර කරුවන් හෝ බූදලය පිළිබඳ සැලකිල්ලක් දක්වන්නකු හෝ දක්වන්නන් විසින් වර්ෂ 1966 ක්වූ පෙබරවාරි මස 16 වෙනි දින හෝ එදිනට පෙර මෙම උසාවියට ඒත්තු යනාකාරයට සෑහෙන විරුද්ධවාදී කම් ඉදිරිපත් නොකළ හොත් ඉහත නම් සඳහන් පෙත්සම්කාරිය නැසීගිය අයගේ වැන්දඹුව බැවින් එකී බූදලය පිළිබඳ අද්මිනිස්ත්‍රාත් බල පත්‍ර ඇය වෙත පවරා දෙන්ට යෙදෙන බැව් නියෝග කර සිටීමට යෙදුනා ඇත.

ඩී. විමලරත්න,
දිස්ත්‍රික් නඩුකාර තැන.

1965 ඔක්තෝබර් 1 වෙනි දින දීය.

2-721

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි